ඔබ අතරින් කිසිවකු හෝ සභාවකට ගිය විට, ඔහු (ඔවුනට) සලාම් පැවසිය යුතුය. ඔහු නැගිට යන්නට සිතූ විට ද සලාම් පැවසිය යුතුය. පළමුව අවසානයට වඩා උතුම් වන්නේ නැත

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. "ඔබ අතරින් කිසිවකු හෝ
සභාවකට ගිය විට, ඔහු (ඔවුනට) සලාම් පැවසිය යුතුය. ඔහු නැගිට යන්නට සිතූ විට ද සලාම් පැවසිය යුතුය. පළමුව අවසානයට වඩා උතුම් වන්නේ නැත." [حسن] [رواه أبو داود والترمذي والنسائي في الكبرى وأحمد]

කිසියම් කෙනෙකු රැස්ව සිටින සභාවකට ගිය විට, ඔහු ඔවුනට සලාම් පැවසිය යුතු බවත්, ඔහු ඉන් නැගිට යන්නට සිතූ විට සලාම් පවසා සමුගත යුතු බවත් පැමිණෙන අවස්ථාවේ පවසනු ලබන පළමු සලාමය, පිටත්ව යන අවස්ථාවේ අවසානයට පවසන සලාමයට වඩා උතුම් නොවන බවත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ පවසා මඟ පෙන්වූහ.

http://www.sunnah.global/hadeeth/si/show/3173